


ශ්‍රී. බු. ව. 2556 අධි බිනර මස කලාපය, රා. ව. 2012 ක් වූ අගෝස්තු මස 31 වන දින

මාතර,ශ්‍රී සුදර්ශි විද්‍යායතන පරිවෙනාධිපති දෙවිනුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති

**ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.**

**රන්වන් මොණරාගේ චරිතාදර්ශයෙන් ආරක්‍ෂාව සලසා ගනිමු.**

බුදදක නිකායේ ජාතක පාලියේ මෝර ජාතකය)

**ගෞරවණීය ස්වාමීන් වහන්ස,**

**කාරුණික පින්වත්නි,**

**අද අධි බිනර පුරපසළොස්වක පොහොය දිනයයි. මේ වර්ෂයට එක පොහොයක් වැඩි වී ඇත. වස්සාන කාලය තුළ යෙදී තිබෙන මෙම පසළොස්වක පෝය දිනයෙහි මෙම දහම් පණිවිඩයෙන් අප බලාපොරොත්තු වන්නේ ගිහි පැවිදි අප හැම දෙනාටම අවශ්‍ය කරන ආරක්‍ෂාව පිළිබඳ පණිවිඩයක් බෝධිසත්ව චරිතා දර්ශයක් තුළින් ලබා දීමයි.**

ආරක්‍ෂාව ක්‍රම දෙකකට සිදුකරගත හැකිය. බාහිර ආරක්‍ෂාව සහ ආධ්‍යාත්මික ආරක්‍ෂාව වශයෙනි. සමාජයේ බොහෝ දෙනාට බාහිර ආරක්‍ෂාව නො අඩුව තිබෙන බව පෙනේ. ගෙවල් තනා ගැනීම, ඒවටා වැට කඩොලු හෝ තාප්ප බැඳ ගැනීම. සමාජයේ ඉහළ තනතුරු දරන අයට ත්‍රිවිධ හමුදාවේද ආරක්‍ෂාව ලැබේ. මේ සියල්ල බාහිර ආරක්‍ෂාවෝය. බෞද්ධයින් හැටියට අප නිතරම ක්‍රියාකළ යුත්තේ ආධ්‍යාත්මික ආරක්‍ෂාව ඇතිකර ගැනීමයි. එවිට බාහිර ආරක්‍ෂාවද නිරායාසයෙන්ම ඇතිවන්නේය.

නමුත් නූතනයේ සමහර දෙනා මේ සඳහා පිරිත් ස[ඣායනා කිරීම යොදාගෙන තිබේ. ගුවන් විදුලිය මගින් නිතර ඇසෙන පිරිතක් ලෙස මෝර පිරිත දැක්විය හැක. ඔවුන් ඒ පිරිත ගැන ප්‍රචාරය කරන්නේ මෙසේය. 'මෙතැන් සිට මහානුභාව සම්පන්න මෝර පරිතත රාජයා ප්‍රචාරය කරනු ලැබේ. එමඟින් සියළු භය දුරුවී ආරක්‍ෂාව සැලසෙයි. මෙම පිරිත නිතර කීම වරදක් නැත. නමුත් ඇතුළත ගුණ ධර්ම නැති අය මෙම පිරිත ලක්‍ෂවාරයක් කීවද ඉන් ප්‍රතිඵලයක් නැත. අද බොහෝ දෙනා ගුණධර්ම වලින් ඈත් වී පිරිත් වලින්, බෝධි පූජාවලින්, වෙනත් ශාන්ති කර්ම වලින් ආරක්‍ෂාව ලබා ගැනීමට සූදානම් වී සිටිති. ඒවා නිරර්ථක වැඩ පිළිවෙල ලෙස අවබෝධ කර ගත යුතුයි.

නූතන සමාජයේ බොහෝ දෙනා ප්‍රතිපත්ති පූජාවෙන් ඈත් වී ආමිස පූජාවට බරවීම නිසා සිදුවී ඇති බරපතල හානියක් ලෙස ඉහත කී තත්වය පෙන්වා දිය හැකිය. ආමිස පූජා වැදරදක් නැත. නමුත් ඒවායෙහි සීමාවන් ඉක්මවා නොයා යුතුයි. මේ තත්වය ඉදිරියට මේ ආකාරයෙන්ම ගමන් කළ හොත් බෞද්ධ සමාජය අනාරක්‍ෂිත තත්වයට පත් වෙයි. දැනටමත් ඒ ලකුණු පහළ වී තිබේ. ඒ නිසා ඒ තත්වය වළකා සමස්ත සමාජයම ආරක්‍ෂාකර ගැනීම ගිහි පැවිදි කාගේත් යුතුකම විය යුතුය. වැලිගම ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදයේ අපේක්‍ෂාවද එයමය.

බණවර හතරකින් යුක්ත පිරුවානා පොත් වහන්සේ තුළ ඉහත කී මෝර පිරිත සඳහන් වන්නේ පළමුවන බණ වරෙහිය. එම පිරිත් පොතට මෙම සූත්‍රය ගෙන තිබෙන්නේ ඛුද්දක නිකායේ ජාතක පාලි නම් ග්‍රන්ථයෙනි. ජාතක පාලියේ

දුක නිපාතයෙහි මෝර ජාතක වශයෙන් මෙම සූත්‍රය එයි. ජාතක පොතේ මහා මෝර ජාතක වශයෙන් දැක්වේ.

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන කල්හි සසුන කෙරෙහි කලකිරුණු භික්ෂුවක් මුල්කරගෙන මෙම මෝර ජාතකය දේශනා කර ඇත. කලකිරුණු භික්ෂුව කැඳවා ඊට හේතු විචාල කළ එම භික්ෂුව කියා සිටියේ අලංකාර කොට සරසන ලද ස්ත්‍රී රූපයක් දැකීම නිසා සසුන ගැන කලකිරුණ බවයි. මෙහිදී බුදුන් වහන්සේ එම භික්ෂුවට නිග්‍රහ කළේ නැත. 'මහණ, ඔබ වැන්නෙකුගේ සිත ස්ත්‍රියක් නිසා කැළඹීම පුදුමයක් නොවේ. පෙර දවස අවුරුදු 700ක් බ්‍රහ්මචර්යාවට පුහුණු කළ මා වැන්නවුන්ගේ සිත ද කැළඹීමට පත් විය. මෙසේ දේශනා කොට එම භික්ෂුවගේ ආරක්ෂාව සඳහා මෝර ජාතකය දේශනා කළහ.

අප මහා බෝසතාණන් වහන්සේ එක්තරා ආත්මභාවයක රන්වන් සිරුරක් ඇති මොණරෙක්ව උපන්හ. මේ මොණරා දිය බොන අවස්ථාවක තමාගේ සිරුර දැක මෙවන් සිරුරක් ඇති මට කරදර පැමිණිය හැකිවේයයි සිතා කාහටවත් නොදන්වා වන ගතවිය. හිමාල පර්වතයේ පර්වත වලලු තුනකින් වටවූ තැන හතර වන පර්වතයෙහි දණ්ඩක හිරඤ්ඤ නම් ස්ථානය මේ මොණරාගේ ආරක්ෂිත ස්ථානය විය. බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කරන මෙම බෝසත් මොණරා උදේ පාන්දර සහ සවස් කාලයෙහි පිරිතක් සජ්ඣායනා කරයි. අප මෝර පිරිත කියා කියන්නේ එයට යි.

**උදෙතයං චක්ඛුමා එක රාජා - හරිස්සවණ්ණො පඨවිප්පභාසො**

**තං තං නමස්සාමි හරිස්සවණ්ණං - පඨවිප්පභාසං - තයජ්ජ ගුත්තා විහරෙමු දිවසං**

ලොවටම එක ඇසක් වැනිවූ, එකම රජෙක් වැනි වූ, රන්වන් පාටින් පොළොව බබළවන්නා වූ සූර්යයා උදාවෙයි. මම ඒ සූර්යයාට වඳිමි. සූර්යා විසින් අද දින දවල් කාලයෙහි මට ආරක්ෂාව සලසා දෙත්වා.

යෙ බ්‍රාහමණා  වෙදගු සබබ ධමෙම - තෙ මෙ නමො තෙච මං පාලයනතු

නමත්‍ථු බුද්ධානං නමො බොධියා නමො විමුතතානං නමො විමුතතියා

ඉමං සො පරිතතං කත්‍වා මොරො චරති එසනා

සියලු ස්කන්‍ධ ධර්‍මයන් සිය නුවණින් දැනගත් කෙලෙස් නැතිකළ යම් බමුණෙක් වෙත් ද, ඔවුන්ට මම නමස්කාර කරමි. සියලු බුදුරජාණන් වහන්සේලාට මම නමස්කාර කරමි. එම අවබෝධයට ද, විමුක්ත පුද්ගලයින්ටද, විමුක්තියට ද, මම නමස්කාර කරමි. ඒ සියලුම දෙනාගේ ආරක්‍ෂාව ලබමින් මම ආහාර සොයා හැසිරෙමි.

මෙසේ ආරක්‍ෂිතව ජීවත් වන රන්වන් මොණරා දිනක් එක් වැද්දෙකුට මුණගැසිනි. එම වැද්දා ගෙදර ගොස් තම පුතුට මේ රන්වන් මොණරා ගැන විස්තර කියා දුන්නේ කවදා හෝ ඔබට මේ මොණරාගෙන් වැඩක් වේය යන අදහසිනි. මේ කාලයෙහි බරණැස් රජුගේ ඛේමා නම් බිසවට රන්වන් මොණරෙකුගෙන් බණ ඇසීමට ආශාවක් උපන්නා ය. ඒ බව රජුට දැන් වූ පසු රජතුමා බමුණන් ගෙන්වා රන්වන් මොණරෙකු ලබා ගන්නේ කෙසේ දැයි ඇසීය . එවිට බමුණන් කීවේ වැද්දන් ගෙන්වා ඔවුන්ගෙන් විචාල යුතු බවයි. වැද්දන් ගෙන්වා විචාල කළ ඉහත කී වැදි පුත්‍රයා තමපියාගෙන් දැනගත් පරිදි මෙම ආරංචිය රජතුමාට කීහ. රජතුමාගේ අණ පරිදි එම වැදි පුත්‍රයා මොණරා ඇල්ලීමට ගොස් කොතරම් උත්සාහ ගත්ත ද මොණරා අල්වා ගත නොහැකි විය. රන්වන් මොණරෙකුගෙන් බණ ඇසීමට නොහැකි වූ නිසා ඛේමා දේවිය පරලොව ගියාය. රජතුමා වේදනාවට පත්ව තම බිසව තමාට අහිමිවූයේ මේ මොණරා නිසායයි සිතා මේ මොණරා මරා මස් කෑ කෙනෙකු වේ නම් ඔහු අජරාමර (නොමැරේ යයි) රන්පතක ලියා රජ ගෙදර තැබීය. එසේ ලියා තැබූ රජතුමාද පරලොව ගිය පසු ඊලග්ගට රජ පැමිණි රජවරුන් ද මේ රන්පතට අනුව මොණරා අල්වා ගැනීමට උත්සාහ කළ හ. එම උත්සාහයන් ද අසාර්ථක විය. අන්තිමේදී ඉතා දක්‍ෂ වැදි පුත්‍රයෙකු මේ මොණරා අල්වා ගැනීමට ගොස් ඉතා පරීක්‍ෂාකාරී විය. මේ මොණරා උදේට සහ සවසට යමක් ප්‍රකාශ කරයි. එය බලවත් මන්ත්‍රයක් විය යුතුයි. මොණරා ආරක්‍ෂාවන්නේ එම මන්ත්‍රය ජප කරන නිසා විය යුතුයි. මෙසේ සිතා එම මන්ත්‍රය ජප නොකරන තත්වයට කටයුතු යයි සිතා සෙබඩෙකු අල්වා ගෙන අතින් සංඥාවක් දුන් පසු ඇය නාදනා ආකාරයට

පුරුදු කරවීය. දිනක් වැදි පුත්‍රයා උදේම එම පර්වතය සමීපයට ගොස් අර සෙබඩ හැඩවීය. රාග නිශ්‍රිත එම හඩ ඇසුණු පසු මෙතෙක් පුරුදු කළ ආරක්ෂක පිරිත අමතක විය. සෙබඩා සිටින තැනට පියාසර කරගෙන අවුත් උගුලට හසුවිය. පසුව එම වැදි පුත්‍රයා මේ රන්වන් මොණරා රාජමාලිගයට ගෙනවිත් රජුට පෙන්වීය. එහිදී මොණරා අසන්නේ මා මෙසේ ගෙන ආවේ කුමකට ද කියායි. ඔබ මරාගෙන මස්කන්නට යයි කී විට ඊට හේතු විචාලහ. ඔබ මරා මස් කෑ කෙනෙකු වේනම් ඔහුට නොමැරී ජිවත් විය හැකියයි මේ රන් පතේ ලියවා ඇත. ඒ නිසා ඔබ අල්වා ගතිමියි කීහ. එවිට රන්වන් මොණරා කියන්නේ මමත් මැරෙන විට මගේ මස් කන අය නොමැරී සිටින්නේ කෙසේද කියායි. මෙසේ මොණරා රජුට බණ කීවිට රජතුමා පැහැදී තම රාජ්‍යය මොණරාට පූජා කළහ. මොණරා දින කිහිපයක් රජගෙදර සිට රජතුමාට රාජ්‍යය පවරා නැවතත් තමා සිටි තැනට ගිය බව මෙම කථා ප්‍රවෘතියේ සඳහන් වේ. මෙම කථාව අසා සිටි උකටලී වූ භික්ෂුව සියලු කෙලෙස් නැතිකොට දෙලොවින්ම ආරක්ෂිත වූ බව සඳහන් වේ.

මේ බෝධිසත්ව රන්වන් මොණරා උදේම නැගිගෙන එන හිරුට නමස්කාර කරයි. සවස බැස යන සූර්යාට නමස්කාර කරයි. ඉන්දියානු සමාජයේ සූර්යා යනු දෙවියෙකි. සූර්යා යනු මුලු මහත් පරිසරයම සජිවී කරන්නාවූ වස්තුවකි. එම සූර්යාට වන්දනා කරනවාය කියන්නේ පරිසර හිතකාමීව ජිවත්වීමයි. මේ රන්වන් මොණරා පරිසරයට හිතවත්ව ජිවත් වූ නිසා හිරුගේ ආරක්ෂාව ඇතිව ජිවත් විය. මෙහි වන්දනාව යනු, දෑත් එක්කර කරන වන්දනාව පමණක් නොවේ. ඒ ගෞරවය සමගම පරිසර හිතකාමීව ජිවත් වීම ඉහළම වන්දනාව වේ.

ඉන් අනතුරුව මේ මොණරා බුද්ධාදී උතුමන්ට නමස්කාර කරයි. බුද්ධාදී උතුමන් යනු පරිසරයට හිතවත්ව ක්‍රියා කරන උතුමන් පිරිසකි. ඒ උතුමන් දේශනා කළ ධර්මයද පරිසර හිතකාමී යුක්ති ධර්මයකි. ඒ උතුමන්ට සහ ඉදිරිපත් කළ ධර්මයට නමස්කාර කරනවාය කියන්නේ දෑත් එක්කර කරන වන්දනාව පමණක් නොවේ. ඒ උතුමන් පරිසරයට ද්වේශ නොකළ යුතුයි. පරිසරය සමග පෑහී ජිවත් විය යුතුය යනුවෙන් දේශනා කොට ඇත්නම් ඒ අනුව ක්‍රියාත්මක වීමයි.

අපේ බෝධිසත්ව රන්වන් මොණරා දුන් මේ පරිසර හිතකාමී පණිවිඩය ගිහි පැවිදි අප හැම දෙනාගේම ජිවිත ආරක්ෂාකර ගැනීමට හේතුවක් වෙයි. දෙමාපියන්ගෙන් ඈත් වී පන්සලට එන දරුවට තම ගුරුදේව නාහිමියන් මවක්

මෙන්ම පියෙක් ද වෙයි. බුදුරජාණන් වහන්සේ දිනක් මහණෙනි සැරියුත් හිමි ඔබවහන්සේලාට මවක් වැනිය. මුගලන් හිමි පියා වැනි යයි දේශනා කළේ මේ පූර්වාදර්ශය සඳහායි. එසේ නම් රන්වන් මොණරා උදේ සවස සූර්යාට වන්දනා කළත් අපි සූර්යාට නොවැඳිමු. නමුත් අපේ පන්සල තුළ සූර්යයෙක් සහ චන්ද්‍රයෙක් සිටී. ඒ තමා පැවිදි කළ ලොකු හාමුදුරුවන් ය. ඒ සූර්යාට සහ චන්ද්‍රයාට අපි උදේ සවස දෑත් එක්කොට වඳිමු. එයම සූර්ය චන්ද්‍ර වන්දනාව නොවේ. තම ගුරුදේවයාණන් වහන්සේ නොකළ යුතුයැයි කියන කිසිවක් අප නොකළ යුතුයි. නූතන භික්ෂු සමාජය තුළ මෙසේ ක්‍රියා කරමින් තම පැවිදි ජිවිතය ආරක්‍ෂා කර ගන්නා භික්‍ෂූන් වහන්සේලා දැකිය හැකිය. නමුත් සමහර භික්ෂූන් වහන්සේලා දෑත් එක්කර ගුරුවරුන්ට වන්දනා කළත් අවශ්‍යම වන්දනාව සිදු නොකරති. ඒ නිසා එවැනි භික්‍ෂූන් වහන්සේලා ගැන ඇසෙන පුවත් වලින් පෙනී යන්නේ උන්වහන්සේලා අනාරක්‍ෂිත වී ඇති බවයි. තමා ගත කරන පැවිදි ජිවිතය අනාරක්‍ෂිත කිරීමට මොණරෙක් හෝ සෙබඩෙක් ඉදිරිපත් උනොත් බුද්ධිමත්ව ක්‍රියාත්මක වී සූර්යා සහ චන්ද්‍රයා හමුවී උපදෙස් ලබා ගත යුතුයි. එසේ ක්‍රියාත්මක වුවහොත් භික්‍ෂු සාසනය ආරක්‍ෂා කර ගැනීමට හැකිවෙයි.

භික්‍ෂූන් වහන්සේලා හැටියට බුද්ධ වන්දනාව කළ යුතුයි. උදේට සවසට දෑත් එකතුකොට කරන එම වන්දනාව ප්‍රමාණවත් නොවේ. බුදුන්වහන්සේලා දේශනා කළ ධර්ම මාර්ගයට අනුව කටයුතු කල යුතුයි. ධර්‍මය තුළ පරිසර හිතකාමී නොවන දේ දේශනා කොට ඇත්නම් ඒවායින් ඈත්විය යුතුයි. සාමණේර භික්‍ෂූන් වහන්සේලාට නියමිත සාමණේර දස ශීලයත් උපසම්පදා භික්‍ෂූන් වහන්සේලාට නියමිත උපසම්පදා ශීලයත් පරිසර හිතකාමී ආචාරධර්‍ම පද්ධතියකි. ඒවා ආරක්‍ෂා කරගෙන ක්‍රියා කරන විට එම භික්‍ෂුවගේ ජිවිතය ආරක්‍ෂිත වේ. එසේ ක්‍රියාත්මක නොවී ඉහත කී මෝර පිරිත 108 වරක් හෝ ලක්‍ෂවාරයක් කීමෙන් ලැබෙන ආරක්‍ෂාවක් හෝ ගුණයක් නැත.

ගිහි සමාජයද මෙම මයුර ආදර්ශය තම ජිවිතයට ගෙන තම ජිවිත ආරක්‍ෂා කර ගත යුතුයි. ගිහි ගෙදර චන්ද්‍රයෙක් සහ සූර්යයෙක් ඇත. සූර්යයා යනු පියායි. චන්ද්‍රයා යනු මවයි. මේ දෙදෙනාට උදේ සවස දෑත් එක්කර වන්දනා කළ යුතුයි. මේ දෙදෙනා නැත්නම් අප කියා කෙනෙක් නැත. නමුත් එම වන්දනාව පමණක් ප්‍රමාණවත් නොවේ. එම දෙමාපියන් කරන අවවාද අනුශාසනා වලට අනුව ක්‍රියා කළ යුතුයි. නොකළ යුතුයයි  කියන කිසිවක් නොකළ යුතුයි. එසේ කිරීම උතුම්ම වන්දනාවයි. එසේ කරන දරුවන්ට කිසිදු කරදරයක් සිදු නොවෙයි. නමුත් නූතන සමාජයේ සමහර දරුවන් දෙමාපියන්ට දෑත් එක්කර කරන

වන්දනාව කළත් අවශ්‍යම වන්දනාව සිදු නොවෙයි. එම නිසා එම දරුවන් අනාරක්ෂිත තත්වයට පත් වී තිබේ.

පිරිමි දරුවනි, ඔබ ඔබේ දෙමාපියන්ගේ වචනවලට අනුව හොඳින් ඉගෙනීමේ කටයුතු කරගෙන තම ජීවිතය සාර්ථක කර ගැනීමට කටයුතු කරන විට ඒ මග වළකාලන සෙබඩියන්ගේ හ්ඩවල් ඇසෙන්නට පුළුවන. එවිට එම සෙබඩියන්ට මෙසේ කියන්න. "පින්වත් සෙබඩියනි, මා ඉගෙන ගන්නා අයෙකි. අපේ ගෙදර ඉරක් සහ සඳක් ඇත. ඒ ඉරෙන් සහ හඳෙන් අවසර නොගෙන මම කිසිවක් නොකරමි. ගැහැණු දරුවෙනි. ඔබ ඔබේ දෙමාපියන්ගේ වචන වලට අනුව හොඳින් ඉගෙනීමේ කටයුතු කරගෙන තම ජීවිතය සාර්ථක කර ගැනීමට කටයුතු කරන විට ඒ මග වලකා ලන මොණරුන්ගේ හ්ඩවල් ඇසෙන්නට පුළුවන. එවිට එම මොණරාට මෙසේ කියන්න. පින්වත් මොණරාණෙනි, මා ඉගෙන ගන්නා අයෙකි. අපේ ගෙදර ඉරක් සහ හඳක් ඇත. ඒ ඉරෙන් සහ සහ හඳෙන් අවසර නොගෙන මම කිසිවක් නොකරමි. මෙසේ මව්ට සහ පියාට වන්දනා කළොත් අපේ මොණරුන්ගේ සහ සෙබඩියන්ගේ ජීවිත ආරක්ෂා වනු ඇත. සමාජය තුළ ජීවත් වන වැඩිහිටි අයද තම දෙමාපියන් වන සූර්යයාට සහ චන්ද්‍රයාට ඉහත කී ලෙස වන්දනා කළොත් ඒ හැම දෙනාගේම ආරක්ෂාව සිදුවනු ඇත.

ගිහි බෞද්ධයින් තම නිවෙස්වල උදේ සවස බුද්ධ වන්දනාව කිරීම ඉතා වැදගත් චාරිත්‍රයකි. දෑත් එක්කොට කරන එම බුද්ධ වන්දනා මෙන්ම බුදුරජාණන් වහන්සේලා විසින් නොකළ යුතුයයි දේශනා කළ දෙයින් ඈත්ව ක්‍රියා කිරීම උතුම්ම බුද්ධ වන්දනාවයි. සියලු පව් නොකිරීමත්, සියලු කුසල් කිරීමත් තම සිත පිරිසිදු කර ගැනීමත් යන මේවා බුදුන්වහන්සේලාගේ අනුශාසනාවෝය. එසේ ක්‍රියා කරන්නා පරිසර හිතකාමියෙක් වෙයි. අපිට නොකල යුතුයයි දේශනා කළ පන්සිල් වලින් කෙරෙන්නේ මුළු මහත් ජීව අජීව පරිසරයම ආරක්ෂා කර දීමකි. එසේ කිරීම වැදගත්ම බුද්ධ වන්දනාවකි. පංච දුශ්චරිත වලින් වෙන් වී ක්‍රියා කරන පුද්ගලයාගේ ජීවිතය ආරක්ෂිතය. බුදුන් වහන්සේ දේශනා කළ හැම ශික්ෂා පදයක්ම කඩ නොකොට ආරක්ෂා කිරීම තුලින් අපේ දෙලොවම ආරක්ෂා වනු ඇත.